# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No : 10120

ෆැක්ස් / தொலைநகல / Fax : 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone : 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site : www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail : dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO : 1475/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No : / 2023 திகதி

දිනය / Date : 27/11/2023 පැය 0535

# මාධ්‍ය නිවේදනය

## 01. නාඳුනන පිරිමි මෘත ශරීරයක් හමුවීම - කිලිනොච්චිය පොලිස් වසම.

2023.11.26 වන දින රාත්‍රී කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ රෝහල අසල දුම්රිය මාර්ගයේ නාඳුනන පිරිමි පුද්ගලයකුගේ මළ සිරුරක් ඇති බවට කිලිනොච්චිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 25 ත් 30 අතර වයසේ පසුවන උස අඩි 05 ක් පමණ වූ පුද්ගලයෙකු වන අතර නිල්පාට ඩෙනිම් කොට කලිසමක් හා නිල්පාට අත්දිග ටීෂර්ටයක් හැඳ සිට ඇත.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ එම ස්ථානයේ ඇති අතර මෙම මරණය දුම්රියේ ගැටී මියයාමක් ද, සියදිවි නසා ගැනීමක් ද නොඑසේනම් වෙනත් අපරාධයක් ද යන්න සම්බන්ධයෙන් කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා රාජගිරිය කඳවුර.

2023.11.26 වන දින දහවල් කාලයේ ගොතටුව පොලිස් වසමේ බෝපැත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් විශේෂ කාර්ය බලකා රාජගිරිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 550 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගොතටුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 43 ක් වන බෝපැත්ත, ගොතටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගොතටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**03.** **හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - කළුතර කොට්ඨාස දූෂණ මර්දන ඒකකය.**

2023.11.26 වන දින දහවල් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ රෝහල ආසන්නයේදී කළුතර කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 27 ක් වන බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.11.26 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 27 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**05.** **පුරාවස්තු සොයා කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගොල්ලාගම පොලිස් ස්ථානය.**

2023.11.26 වන දින දහවල් කාලයේ මොරගොල්ලාගම පොලිස් වසමේ කුඹුක්කඩවල ප්‍රදේශයේ නිවසක කාමරයක් තුල දී නීති විරෝධී කැණීම් කටයුත්තක් සිදුකරන බවට මොරගොල්ලාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **පුරාවස්තු සොයා කැණීම් කරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ ද සමඟ අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 20 ක් වන කුඹුක්කඩවල, මොරගොල්ලාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැටලීම සිදුකරන ලද අවස්ථාවේ සැකකරුවන් තිදෙනෙකු පලාගොස් ඇති අතර පලාගිය සැකකරුවන් මේවන විට හඳුනාගෙන ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මොරගොල්ලාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**06.** **නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර උතුර පොලිස් ස්ථානය.**

2023.11.26 වන දින දහවල් කාලයේ කළුතර උතුර පොලිස් වසමේ තෝරගල්ල ප්‍රදේශයේදී කළුතර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට උපයෝගි කර ගන්නා ගෝඩා**

**ලීටර් 1800 ක් (බැරල් 10) ක් සහ නීති විරෝධී මත්පැන් ලීටර් 50 ක්, ගෑස් සිලින්ඩර් 04 ක්, තඹ දඟරයක් හා ගෑස් උඳුන් දෙකක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන පැල්පිටගොඩ, පෝරුවදණ්ඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර උතුර පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - වැලිකඩ පොලිස් වසම.

2023.11.26 වන දින උදෑසන කාලයේ වැලිකඩ පොලිස් වසමේ අග්ගොන අඹගහහන්දිය මාර්ගයේ කලපලුවාව පාසල් පටුමග අසල පදික මාරුව අසලදී අග්ගොන දෙස සිට අඹගහ හන්දිය දෙසට ධාවනය වූ කාර් රථයක පදික මාරුව මතින් පාර මාරුවීමට ගිය පදිකයකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා අයි.ඩී.එච්. රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 78 ක් වූ කලපලුවාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අයි.ඩී.එච් . රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැලිකඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**